# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක: **13/2015**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07
2015 සැප්තැම්බර් මස 18වැනිදා

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම්</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් 2015.05.25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015 හි ප්‍රතිපාදන අනුගමනය කරමින් නිකුත් කරන ලද 2015.06.25 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක: 09/2015 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

2. 2015.09.03 පැවති සිය 924වන සභා වාරයේ දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015.06.25 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක: 09/2015, පහත සඳහන් ප්‍රතිපාදන සමඟ <u>ප්‍රතිස්ථාපනය</u> කිරීමට තීරණය කරන ලදී.

3. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නිල වාහන භාවිත කිරීමට හිමිකාරීත්වය, නිල වාහන හිමි නිලධාරීන් සඳහා මාසික ඉන්ධන සීමාව, නිල වාහන සැපයීම වෙනුවට මාසික ප්‍රවාහන දීමනා ගෙවීම 2015.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් සංශෝධනය කෙරේ.

4. නිල වාහන හිමිකාරීත්වය සහ ඉන්ධන දීමනා සීමාවන්

- විශ්වවිද්‍යාල පද්ධතියේ නිල වාහන ලබා දෙනු ලබන නිලධාරීන් සහ අදාළ ඉන්ධන දීමනා පහත සඳහන් වගුවෙහි දැක්වේ. මෙම කාර්යය සඳහා නිලධාරීන්ගේ රාජකාරියේ ස්වභාවය සහ රැකියාවේ වගකීම් සැළකිල්ලට ගෙන ඇත.

- නිලධාරියෙකුට පැවරී ඇති රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා මාසික ඉන්ධන සීමාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවන්හි දී, පහත සඳහන් පරිදි අනුමැතිය ලබා ගැනීමෙන් පසු නිලධාරියා විසින් දරන ලද අමතර ඉන්ධන වියදම සත්‍ය අතිරේක ඉන්ධන භාවිතය මත පදනම්ව ප්‍රතිපූර්ණය කළ හැක.

  * සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙතින්
  * උප සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
  * උප කුලපතිවරුන් - සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
  * අනෙකුත් නිලධාරීන් - පාලන අධිකාරිය

  ( එවැනි ඉල්ලීම් පාලන අධිකාරියේ නිර්දේශය සමඟ යොමු කළ යුතුය)

- නිල වාහනයක් හිමි නිලධාරියෙකුට එම නිල වාහනය භාවිත කිරීම හෝ නිල වාහනය වෙනුවට රු.30,000/-ක මාසික ප්‍රවාහන දීමනාවක් සහ අදාල තනතුරට හිමි මාසික ඉන්ධන දීමනාව ලබා ගැනීම යන විකල්ප දෙකෙන් එකක් තෝරා ගත හැකිය. කෙසේ වුවද, එවැනි නිලධාරීන්ට රියදුරකු හෝ රියදුරු දීමනාවක් ලබා දෙනු නොලැබේ.

- ප්‍රවාහන දීමනාව සහ ඉන්ධන දීමනාව මාසික වැටුපට එකතු කොට ගෙවීම් කරනු ඇත.

- නිල වාහනයක් ලබා ගැනීමට හෝ ප්‍රවාහන දීමනාවක් ලබා ගැනීමට හිමිකම ලබන නිලධාරීන්, වාහන සංචිතයේ ඇති වාහන ද ඇතුළත්ව වෙනත් කිසිදු කාර්යාලයීය වාහනයක් භාවිත කිරීමට අවසර නොලබයි.

*2 පිටුවට .....*

- නිලධාරීන් කණ්ඩායමක්, සේවා ස්ථානයෙන් කිලෝ මීටර් 40ට වඩා දුර විශේෂ රාජකාරී කටයුතු සඳහා සහභාගි වන අවස්ථාවක දී, කණ්ඩායමට එක්ව ගමන් කිරීමට ප්‍රවාහන පහසුකම් සලසා දිය හැක.

- යම් නිලධාරියෙක් එක් තනතුරකට වඩා හොබවන්නේ නම්, ඔහු තම නිත්‍ය තනතුරට නියමිත ඉන්ධන දීමනාව පමණක් ලැබීමට හිමිකම් ලබයි. කෙසේ නමුත්, අමතර තනතුර හා අදාළ රාජකාරී ගමන් සඳහා, පාලන අධිකාරියේ අනුමැතිය මත එවැනි තනතුරකට / තනතුරුවලට නියමිත උපරිම සීමාවට යටත්ව අතිරේක ඉන්ධන ලබා ගත හැකිය.

- නිල වාහන හිමි රියදුරන්ගේ පුද්ගලික ගමන් සඳහා රියදුරන්ට ගෙවන අතිකාල හා අනෙකුත් ඒකාබද්ධ දීමනා අදාළ නිලධාරියා විසින් දැරිය යුතුය.

- මසකට වැඩි කාලයක් දේශීය හෝ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා සිටින නිලධාරියෙකුට පාලන අධිකාරියේ විශේෂ අනුමැතියකින් තොරව ප්‍රවාහන දීමනාව ලබා ගැනීම, නිල වාහනය භාවිත කිරීම හෝ රියදුරාගේ සේවය ලබා ගැනීමට හිමිකමක් නොමැත. කෙසේ වුවද, නිලධාරියාගේ පාලනයෙන් බාහිර දිගු කාලීන රෝගී තත්ත්වයන් ආදී හේතු මත මසකට වැඩි කාලයක් වැටුප් රහිත නිවාඩු ලබා සිටින අදාළ හිමිකම ඇති නිලධාරියෙකුට මෙම පහසුකම් ලබා ගැනීමට ඉඩ දිය හැක.

<u>වගුව</u>

| කාණ්ඩ අංකය | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක **01/2015** අනුව නිලධාරී කාණ්ඩයන් | විශ්වවිද්‍යාල පද්ධතියේ ඒ හා සමාන නිලධාරීන් | නව චක්‍රලේඛය අනුව මාසික ඉන්ධන සීමාව (ලීටර්) | අනුමත මාසික ඉන්ධන දීමනාව |
|---|---|---|---|---|
| 01 | සභාපති / නිසි බලධාරී | සභාපති /විශ්වවිද්‍යාල ප්‍ර. කො<br>උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍ර. කො<br>විශ්වවිද්‍යාල උප කුලපති | 170 | අනුමත මාසික ඉන්ධන සීමාව (ලීටර්)<br>×<br>අදාළ මාසයේ පළමු දින පැවති ඉන්ධන මිල |
| 02 | කළමනාකරණ අධ්‍යක්ෂ විධායක අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී / අධ්‍යක්ෂ ජනරාල් | ලේකම් /විශ්වවිද්‍යාල ප්‍ර. කො<br>නියෝජ්‍ය උප කුලපති<br>ආයතන අධ්‍යක්ෂ<br>මණ්ඩපාධිපති | 150 | |
| 03 | ප්‍රධාන මෙහෙයුම් නිලධාරී / ප්‍රධාන මූල්‍ය නිලධාරී | විශ්වවිද්‍යාල ලේඛකාධිකාරි<br>අතිරේක ලේකම් / විශ්වවිද්‍යාල ප්‍ර. කො<br>පීඨාධිපති<br>ප්‍රධාන ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍ර. කො<br>ප්‍රධාන අභ්‍යන්තර විගණක / වි.වි. ප්‍ර. කො<br>පුස්තකාලයාධිපති<br>ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්ර. කො<br>විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරී<br>අභ්‍යන්තර විගණක / වි.වි. ප්‍ර. කො | 140 | |
| 04 | 2006 වසරේ නිකුත් කරන ලද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක MSD 30 ප්‍රකාරව HM1-1 ගණයේ හෝ ඊට ඉහළ එම දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද තනතුරක් දරන වෙනත් ඕනෑම නිලධාරියෙක් | අධ්‍යක්ෂ / අධ්‍යාපනික තාක්ෂණ - විවෘත වි.වි<br>අධ්‍යක්ෂ / ප්‍රාදේශීය අධ්‍යාපන සේවය, විවෘත වි.වි<br>අධ්‍යක්ෂ / මෙහෙයුම් , විවෘත වි.වි<br>අධ්‍යක්ෂ / තොරතුරු තාක්ෂණ (U-EX 3) - පේරාදෙණිය/ කැලණිය/ යාපනය/ විවෘත වි.වි / රජරට වි.වි | 120 | |

*3 පිටුවට ....*

5. උසස් අධ්‍යාපන ආයතන දැනට පවතින වාහන ප්‍රමාණය තුළ මෙම පහසුකම් කළමනාකරණය කර ගත යුතු අතර, මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සඳහා රියදුරන් බඳවා ගැනීමට සේවක සංඛ්‍යා ප්‍රතිපාදන හෝ වාහන මිලදී ගැනීමට ඉල්ලීම් 2015 වර්ෂය තුළ දී මහා භාණ්ඩාගාරය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු නොකළ යුතුය.

6. වාහනවල නිසි පාලනය සහ නඩත්තුව උදෙසා හඳුන්වා දී ඇති සියලුම රීති සහ නියමයන් සහ ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතුය.

7. ආයතන චක්‍රලේඛ ලිපි අංක: 09/2015 ක්‍රියාත්මක වීමත් සමඟ නිල වාහන පහසුකම් සඳහා හිමිකම් ලබන නිලධාරීන් නිලධාරීන්ගේ මාසික ඉන්ධන දීමනාවේ යම්කිසි අඩු /වැඩියක්, 2015 ඔක්තොබර් මස සඳහා ඔවුන්ගේ මාසික ඉන්ධන දීමනාවෙන් ගළපා ගැනීමට ක්‍රියා කළ යුතුය.

8. නව නිලධාරී කාණ්ඩ සඳහා මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන එහි සඳහන් වන අයුරින් 2015.07.01 දින සිට ක්‍රියාත්මක වේ.

9. උක්ත කරුණ යටතේ නිකුත් කරන ලද 1988.05.05 දිනැති අංක 366, 1992.07.20 දිනැති අංක 532 යන කොමිෂන් සභා චක්‍රලේඛ, 2009.03.25 දිනැති මූල්‍ය චක්‍රලේඛ ලිපි අංක 3/2009 හා 2015.06.25 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක: 09/2015 මෙයින් අවලංගු කෙරේ.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: **මහාචාර්ය මොහාන් ද සිල්වා**
**සභාපති**

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. ප්‍රධාන අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය : යූජීසී/එච්ආර්/6/1/23